# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,501 — 1965 සැප්තැම්බර් 9 වැනි බ්‍රහස්පතින්ද — 1965.9.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරණ ලදී)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම භාෂාවකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම ... ... | 129 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | — | | |


## වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් වතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුය

### පරීක්ෂා කිරීමේ වේලාවන්

ආණ්ඩුවේ නිවාඩු දිනයන් හැරුණු විට සතියේ සෙනසුරාද හැර සෑම දිනකම දහයේ සිට හතර දක්වාද, සෙනසුරාද දිනවල දහයේ සිට එක දක්වාද ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර සතියේ දිනවල සවස 3 දක්වා ද, සෙනසුරාද දිනවල දවල් 12 දක්වාද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිවම කාර්යාලයීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

### විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෝ ලාංඡික මුද්දරයක්ද සමඟ ටී. ඇම්. 7 දරන පෝරමය මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැළසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර, සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

— විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නො කළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේ දී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය හැර හැර තිබීමද සැළකිල්ලට ගනු ලැබේ.

# පේටන්ට් බලපත්‍ර ආඥපනත යටතේ නිවේදන

## දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**වර්ෂ 1964ක්වූ ජූනි මස 6 වන දින දරණ 5445 වන අංකය (59.7.3 දින සහ 879,687 වන අංකය දරණ එක්සත් රාජධානි පේටන්ට් බලපත්‍රය, 46 වන වගන්තිය යටතේ ලියාපදිංචිකිරීම)**

**UNIVERSAL OIL PRODUCTS COMPANY**

" සන්තත අවශෝෂණ ක්‍රියාවලිය. "

**සංක්ෂේප සටහන—**

මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. සංරචක කිහිපයකින් යුත් තරල වඩි මිශ්‍රණයක් විභාජනය කිරීම සඳහා සන්තත සංශෝෂණ ක්‍රියාවලියක්. මෙහි දී එකී වඩි මිශ්‍රණය, ඝන ශෝෂකයක් හා ගැටීමට සැලැස්වීමෙන් එකී සංරචක වලින් එකක් වරණීය ව ශෝෂණය කර ගනු ලැබේ. ඉක්බිති එකී ශෝෂකය හා ගැටී ඇති, ඉහත කී මිශ්‍රණයේ ශෝෂණය—නොවූ සංරචකය ඉන් ඉවත් කොට, තරල නිරධිශෝෂකයක මාර්ගයෙන් වරණීය ව ශෝෂණය වූ සංරචකය ශෝෂකයෙන් විස්ථාපනය කරවනු ලැබේ. එහි දී ඉහත කී ඝන ශෝෂකයෙන් යුත් අචල පිඩකින් සමන්විත, ශ්‍රේණිකව සම්බන්ධ කරන ලද විකාශන කලාප හතරක් තුළින් සහ අන්තිම කලාපයේ ඇත්දොරේ සිට ආපසු පළමුවැනි කලාපයේ උවදොර තෙක්, සන්තත තරලයේ චක්‍රීය සංසරණයක් නොකඩවා පවත්වා ගැනීම ; පළමුවැනි කලාපයේ උවදොර අසල දී, සංසරණය වන තරලයට ඉහත කී තරල වඩි මිශ්‍රණය නොකඩවා ඇතුළත් කිරීම ; පළමුවැනි කලාපයේ ඇත්දොර අසල දී සංසරණය වන තරලයෙන් ශෝෂණය—නොවූ සංරචකය නොකඩවා ඉවත් කර ගැනීම ; තෙවැනි කලාපයේ උවදොර අසල දී සංසරණය වන තරලයට නිරධිශෝෂකය නොකඩවා ඇතුළත් කිරීම ; තෙවැනි කලාපයේ ඇත්දොර අසල දී සංසරණය වන තරලයෙන් වරණීයව ශෝෂණය වූ සංරචකය සහ නිරධිශෝෂකය ඉවත් කර ගැනීම ; සහ මේ ක්‍රියාවලි සිදුවෙද්දී ම, ඉහත කී වඩි මිශ්‍රණය ඇතුළත් කරනු ලබන අවස්ථාව ද ශෝෂණය නොවූ සංරචකය ඉවත් කරනු ලබන අවස්ථාව ද නිරධිශෝෂක ඉවත් කරනු ලබන අවස්ථාව ද කලින් සිදු කරවීමෙන් ඉහත කී අචල ශෝෂක පිඩෙහි කලාප හතර විටින් විට ඉදිරියට ගෙන ඒම ; මෙම ක්‍රියාවලියේ දියුණු කරන ලද පියවර වෙයි.

අයිතිය ප්‍රකාශ කිරීම් 10ක් ද, රූ සටහන් පත් 2ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක්වූ ජූලි මස 21 වන දින,
කොළඹ දී ය.

9-311/1

---

## දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**වර්ෂ 1964ක්වූ ජූනි මස 6 වන දින දරණ 5446 වන අංකය (61.1.19 දින සහ 904,732 වන අංකය දරණ එක්සත් රාජධානි පේටන්ට් බලපත්‍රය, 46 වන වගන්තිය යටතේ ලියාපදිංචිකිරීම)**

**UNIVERSAL OIL PRODUCTS COMPANY**

" ඇරොමැටික හයිඩ්‍රොකාබන හයිඩ්‍රජනීකරණය කිරීමේ ක්‍රියාවලිය. "

**සංක්ෂේප සටහන—**

මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. සෙ. 427°ට අධික නොවූ උසස් උෂ්ණත්වවලදී සහ අතිවායු ගෝලීය පීඩණයක දී උත්ප්‍රේරකයක් වශයෙන් උච්ච ලෝහයක් තිබිය දී හයිඩ්‍රජන් සමග ඇරොමැටික හයිඩ්‍රොකාබන හයිඩ්‍රජනීකරණය කිරීම සඳහා ක්‍රියාවලියක් මෙහි දී, ඇරොමැටික හයිඩ්‍රොකාබන හයිඩ්‍රජන්වලින් සෑහෙන තරමට සම්පූර්ණ ව සන්තෘප්ත වීම උත්ප්‍රේරකයක් ආශ්‍රයේ දී සිදු කර වීම මෙහි විශේෂ ලක්ෂණයක් වෙයි. මෙම උත්ප්‍රේරකය, ඇලුමිනා-අන්තර්ගත තාප සහ ඔක්සයිඩයකින් සහ පැලැටිනම් කාණ්ඩයේ ලෝහයක ස්වල්ප ප්‍රමාණවලින් ද ක්ෂාර ලෝහ කාණ්ඩයෙන් සහ ක්ෂාරීය පාංශු ලෝහ කාණ්ඩයෙන් යටත් පිරිසෙයින් එක් ලෝහයකින් ද සමන්විත වෙයි.

අයිතිය ප්‍රකාශ කිරීම් 8 ක් ද, රූ සටහන් පත් 1 ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක්වූ ජූලි මස 21 වන දින,
කොළඹ දී ය.

9-311/2

## දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**වර්ෂ 1964ක්වූ ජූනි මස 6 වන දින දරණ 5447 වන අංකය (61.8.8 දින සහ 913,731 වන අංකය දරණ එක්සත් රාජධානි පේටන්ට් බලපත්‍රය, 46 වන වගන්තිය යටතේ ලියාපදිංචිකිරීම)**

**UNIVERSAL OIL PRODUCTS COMPANY**

" ද්‍රාවකයක් මගින් නිස්සාරණය කිරීමේ ක්‍රියාවලියකින් හයිඩ්‍රොකාබන වෙන් කිරීම. "

**සංක්ෂේප සටහන—**

මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. ද්‍රාවකයක් මගින් නිස්සාරණය කිරීමේ ක්‍රියාවලියක්. මෙහි දී ඇරොමැටික හයිඩ්‍රොකාබන සහ ඇරොමැටික—නොවන හයිඩ්‍රොකාබන අන්තර්ගත හයිඩ්‍රොකාබන මිශ්‍රණයක්, නිස්සාරණ කලාපයක් තුළ දී ද්‍රාවක සංයුතියක් සමග ගැටීමට සලසනු ලැබේ. මෙම ද්‍රාවක සංයුතිය ඉහත කී මිශ්‍රණයේ අන්තර්ගතව තිබෙන ඇරොමැටික සංරචකය වරණීය ව ද්‍රවණය කරයි. මෙම සංයුතියේ, ජලය ද ඉහත කී ඇරොමැටික සංරචකයට ඉහළ උෂ්ණත්වයක දී නටන කාබනික ද්‍රාවකයක් ද අඩංගුව තිබේ. ඉක්බිති ඉන් සෑදෙන රැපිනේටය සහ ද්‍රවණය වූ ඇරොමැටික සංරචකය අන්තර්ගත නිස්සාරක කලාවක්, ඉහත සඳහන් නිස්සාරණ කලාපයෙන් වෙන් වෙන් වශයෙන් ඉවත් කරනු ලැබේ. ඉන්පසු එකී නිස්සාරක කලාව, ආසවන කලාපයක් තුළ ආසවනයකට භාජන කරනු ලැබේ. අනතුරු ව, නිස්සාරණය වූ ඇරොමැටික සංරචකයේ කොටසක් පමණක් අන්තර්ගත ව තිබෙන ආසූත වාෂ්ප ධාරාවක් ද හුමාලය සහ ඇරොමැටික හයිඩ්‍රොකාබන වාෂ්පය අන්තර්ගත ව තිබෙන වාෂ්පමය ධාරාවක් ද ඉහත සඳහන් ආසවන කලාපයෙන් වෙන් වෙන් වශයෙන් ඉවත් කරගනු ලැබේ. මෙහි විශේෂ ලක්ෂණයක් නම් එකී, පැත්තකින් එන වාෂ්පමය ධාරාව, යටකී ආසවන කලාපයේ සිට කෙලින්ම, වෙන්ව ඇති ප්‍රතිශෝධන කලාපයක් තුළට ගලා යෑමයි. මෙම කලාපය තුළදී විභාජනයේ මාර්ගයෙන් එය, ඇරොමැටික නිස්සාරක භාගයක් බවට සහ ද්‍රාවකයෙන් සැලකිය යුතු ව තොර, ජලීය ආසූතයක් බවට වෙන් වෙයි. ඉක්බිති එකී නිස්සාරක භාගය සහ රැපිනේටය ඉහත සඳහන් ජලීය ආසූතයෙන් සෝදා ගනු ලැබේ.

අයිතිය ප්‍රකාශ කිරීම් 7ක් ද රූ සටහන් පත් 1ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක්වූ ජූලි මස 21 වන දින,
කොළඹ දී ය.

9-311/3

## දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**වර්ෂ 1964ක්වූ ජූනි මස 6 වන දින දරණ 5448 වන අංකය (61.2.13 දින සහ 917,469 වන අංකය දරණ එක්සත් රාජධානි පේටන්ට් බලපත්‍රය, 46 වන වගන්තිය යටතේ ලියාපදිංචිකිරීම)**

**UNIVERSAL OIL PRODUCTS COMPANY**

" හයිඩ්‍රොබිඳුම් උත්ප්‍රේරකය "

**සංක්ෂේප සටහන—**

මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. හයිඩ්‍රොබිඳුම් උත්ප්‍රේරකයක් පිළියෙල කර ගැනීම සඳහා ක්‍රියාවලියක්. බිඳුම් බලයක් ඇත්තාවූ ද අවශ්‍ය වශයෙන් සිලිකා වලින් සහ ඇලුමිනා, මැග්නීසියා, ස්කෝනියා සහ තෝරියා යන කාණ්ඩවල යටත් පිරිසෙයින් එක් ඔක්සයිඩයකින්වත් සමන්විත වූ ද තාප සහ ඝන ධාරකයක්, ආවර්තිතා චක්‍රයේ VI ඒ සහ VIII යන කාණ්ඩවලට අයත් ලෝහවලින් යුත් යටත් පිරිසෙයින් එක් සංයෝගයකවත් ද්‍රාවණයත් සමග නිශේචනය කරනු ලැබීම මෙහි විශේෂ ලක්ෂණයකි. මෙකී ද්‍රාවණය වූකලී අන්තිම උත්ප්‍රේරකයේ හයිඩ්‍රජනීකරණය කරන සක්‍රීය ලෝහ සංරචකයක මූල වෙයි. ඉක්බිති සෙ. 700° සිට 760° තෙක් වෙනස් වන උෂ්ණත්වයක දී ඔක්සිකාරක වායුගෝලයක් තුළ පැය 1 සිට 8 දක්වා වූ කාලයක් තිස්සේ නිශේචිත ධාරකය රත් කරනු ලැබේ. මෙසේ ඔක්සිකරණය වූ සංයුක්තය වඩා ඉහළ උෂ්ණත්වයක දී හයිඩ්‍රජන් සමග ඔක්සිහාරක ප්‍රතික්‍රියාවකට භාජන කරනු ලැබේ.

අයිතිය ප්‍රකාශ කිරීම් 10ක් ද, නිදසුන් 5 ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක්වූ ජූලි මස 21 වන දින,
කොළඹ දී ය.

9-311/4

### දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**වර්ෂ 1964 ක්වූ ජූනි මස 6 වන දින දරණ 5449 වන අංකය (62.3.19 දින සහ 931,824 වන අංකය දරණ එක්සත් රාජධානි පේටන්ට් බලපත්‍රය, 46 වන වගන්තිය යටතේ ලියාපදිංචිකිරීම)**

**UNIVERSAL OIL PRODUCTS COMPANY**

"හයිඩ්රොකාබන තෙල් හයිඩ්රොප්‍රසාදනය කිරීමේ සහ බිඳීමේ ක්‍රියාවලිය."

**සංක්ෂේප සටහන—**

මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. නයිට්‍රජනීය සංයෝග ද සෙ. 415° ට ඉහළ උෂ්ණත්වයක දී නටන හයිඩ්රොකාබන ද අන්තර්ගත, ගැසොලින්වලින්-තොර බර හයිඩ්රොකාබන තෙල් වඩියක් පරිවර්තනය කිරීම සඳහා ක්‍රියාවලියක්. මෙහි දී එකී බර තෙල් වඩියෙන් යුත් ධාරාවක්, පළමුවැනි ප්‍රතික්‍රියා කලාපයක් තුළ බිඳවනු ලැබේ. එසේ කළ විට ගැසොලින් නටන උෂ්ණත්ව අන්තරයට ඉහළ උෂ්ණත්වයක දී නටන්නා වූ ද සෙ. 400° සිට 435° දක්වා වෙනස් වන අන්ත තාපාංකයක් ඇත්තා වූ ද අන්තර ඵලයක් ලැබේ. ඉක්බිති ප්‍රාථමික විභාජක කලාපයක් තුළදී, පළමුවැනි ප්‍රතික්‍රියා කලාපයේ සාමාන්‍යයෙන් ද්‍රව හයිඩ්රොකාබන අපවාහයේ අන්තර්ගත ව ඇති උච්ච තාපාංක සංරචකවලින්, ඉහත කී අන්තර ඵලය වෙන් කර ගනු ලැබේ. පසුව දෙවැනි ප්‍රතික්‍රියා කලාපයක් තුළ දී හයිඩ්රජනීකරණය කිරීමේ බලයක් ඇත්තා වූ නයිට්‍රජන් අසංවේදී උත්ප්‍රේරකයක් ආශ්‍රයේ දී ඉහත කී අන්තර ඵලය හයිඩ්රජන් සමග ප්‍රතික්‍රියා කරවනු ලැබේ. එසේ කළ විට නයිට්‍රජනීය සංයෝගවලින් ඇමෝනියා සෑදෙයි. ඉක්බිති ඉහත කී දෙවැනි ප්‍රතික්‍රියා කලාපයේ වූ සාමාන්‍යයෙන් ද්‍රව හයිඩ්රොකාබන අපවාහයෙන්, ඇමෝනියා වෙන් කර ගනු ලැබේ. මීට පසු, දෙවැනි ප්‍රතික්‍රියා කලාපයේ සාමාන්‍යයෙන් ද්‍රව හයිඩ්රොකාබන අපවාහය, තෙවැනි ප්‍රතික්‍රියා කලාපයක් තුළ දී, තවත් හයිඩ්රජන් සහ හයිඩ්රොබිඳුම් උත්ප්‍රේරකයක් ආශ්‍රයේ දී හයිඩ්රො බිඳවනු ලැබේ. ඉන්පසු හයිඩ්රජන්වලින් සැලකිය යුතුව තොර වූ ද සෙ. 340° සිට 370° දක්වා වෙනස් වන අන්ත තාපාංකයක් ඇත්තා වූ ද හයිඩ්රජන් ආසූත ඵලයක්, ද්විතීයික විභාජක කලාපයක් තුළ දී, ඉහත කී තෙවැනි ප්‍රතික්‍රියා කලාපයේ සාමාන්‍යයෙන් ද්‍රව හයිඩ්රොකාබන අපවාහයේ උච්ච තාපාංක සංරචකවලින් වෙන් කර ගනු ලැබේ. ඉක්බිති ඉහත සඳහන් ද්විතීයික විභාජක කලාපයේ සිට, ඉහත කී උච්ච තාපාංක සංරචකවලින් යුත් ධාරාවක්, ඉහත සඳහන් තෙවැනි ප්‍රතික්‍රියා කලාපය වෙතට ආපසු යවනු ලැබේ. අන්තිමේ දී ඉහත කී හයිඩ්රොකාබන ආසූත ඵලය ක්‍රියාවලියෙන් ඉවත් කර ගනු ලැබේ.

අයිතිය ප්‍රකාශ කිරීම් 13 ක් ද, රූ සටහන් පත් 1 ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක්වූ ජූලි මස 21 වන දින,
කොළඹ දී ය.

9-311/5

---

### දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**වර්ෂ 1964 ක්වූ ජූනි මස 6 වන දින දරණ 5450 වන අංකය (61.3.15 දින සහ 933,489 වන අංකය දරණ එක්සත් රාජධානි පේටන්ට් බලපත්‍රය, 46 වන වගන්තිය යටතේ ලියාපදිංචිකිරීම)**

**UNIVERSAL OIL PRODUCTS COMPANY**

"හයිඩ්රොකාබන තෙල් හයිඩ්රොබිඳවීමේ ක්‍රියාවලිය."

**සංක්ෂේප සටහන—**

මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. හයිඩ්රොබිඳුම් උත්ප්‍රේරකයට හානිකර වන, ස්වාභාවික ව පිහිටන කාබනික නයිට්‍රජනීය සංයෝගයකින් දූෂණය වූ පැට්රොලියම් හයිඩ්රොකාබන වඩියක්, උත්ප්‍රේරකයක මාර්ගයෙන් හයිඩ්රොබිඳවීම සඳහා ක්‍රියාවලියක්. මෙහි දී සෙ. 315° සිට 482° දක්වා වූ උෂ්ණත්වයක දී වායුගෝල 34 සිට 204 දක්වා වූ පීඩනයක දී වැඩිපුර හයිඩ්රජන් ප්‍රමාණයක් ආශ්‍රයේ දී ඉහත කී වඩිය, හයිඩ්රොප්‍රසාදන උත්ප්‍රේරකයක් හා ගැටීමට සලසනු ලැබේ. මෙකී උත්ප්‍රේරකය, ආවර්තිතා චක්‍රයේ VI කාණ්ඩයට අයත් ලෝහයකින් සහ VIII කාණ්ඩයේ මූල ද්‍රව්‍යවල යකඩ කාණ්ඩයට අයත් ලෝහයකින් සමන්විත වෙයි. එම උත්ප්‍රේරකය නිශ්ක්‍රිය තාප සහ ලෝහ ඔක්සයිඩ භස්මයක් මත පිහිටුවා ඇත. ඉහත සඳහන් ගැටීම සිදු කරනුයේ එකී නයිට්‍රජනීය සංයෝගයේ ඇති නයිට්‍රජන් සියල්ලම වාගේ ඇමෝනියාවලට පරිවර්තනය කැරෙන පරිදි සහ එකී වඩියේ නයිට්‍රජන් ප්‍රමාණය වඩියේ බරින් කොටස් දශලක්ෂයකට, කොටස් එකකට අඩු ප්‍රමාණයකට අඩු කැරෙන පරිදි උත්ප්‍රේරකයට සාපේක්ෂ වූ අවකාශ ප්‍රවේගයක දී ය. ඉක්බිති ප්‍රතික්‍රියා ඵලයෙන් ඉහත කී ඇමෝනියා වෙන් කර ගනු ලැබේ. මීට පසු සෙ. 260° සිට 538° දක්වා වූ උෂ්ණත්වයක දී සහ වායුගෝල 34 සිට 204 දක්වා වූ පීඩනයක දී හයිඩ්රජන් ආශ්‍රයේ දී ඉහත කී ප්‍රතික්‍රියා ඵලයේ සාමාන්‍යයෙන් ද්‍රව කොටස, උත්ප්‍රේරකයක් සමග ගැටීමට සලසනු ලැබේ. මෙම උත්ප්‍රේරකය වූකලී ආවර්තිතා චක්‍රයේ VIII කාණ්ඩයේ මූල ද්‍රව්‍යවලින් තෝරා ගත් ලෝහයකින් සමන්විත වෙයි. එය අම්ලික බිඳුම් උත්ප්‍රේරක ධාරකයක් මත තැන්පත් කොට තිබෙයි.

අයිතිය ප්‍රකාශ කිරීම් 5 ක් ද, රූ සටහන් පත් 1 ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක්වූ ජූලි මස 21 වන දින,
කොළඹ දී ය.

9-311/6

---

### දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**වර්ෂ 1964 ක්වූ ජූනි මස 6 වන දින දරණ 5451 වන අංකය (61.3.24 දින සහ 934,382 වන අංකය දරණ එක්සත් රාජධානි පේටන්ට් බලපත්‍රය, 46 වන වගන්තිය යටතේ ලියාපදිංචිකිරීම)**

**UNIVERSAL OIL PRODUCTS COMPANY**

"හයිඩ්රොබිඳීමේ ක්‍රියාවලිය".

**සංක්ෂේප සටහන—**

මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. උත්ප්‍රේරකයක මාර්ගයෙන් හයිඩ්රොකාබන හයිඩ්රොබිඳවීම සඳහා ක්‍රියාවලියක්. මෙහි දී යටත් පිරිසෙයින් සෙ. 204° ටත් අධික උෂ්ණත්වයක දී නටන්නා වූ ද නයිට්‍රජනීය සංයෝග අන්තර්ගත වූ ද හයිඩ්රොකාබන තෙල් වඩියෙන් යුත් ධාරාවක්, පළමු වැනි ප්‍රතික්‍රියා කලාපයක් තුළ, නයිට්‍රජන්-අසංවේදී හයිඩ්රො-ප්‍රසාදන උත්ප්‍රේරකයක් ආශ්‍රයේ දී, හයිඩ්රජන් සමග ප්‍රතික්‍රියා කරවනු ලැබේ. එවිට එකී නයිට්‍රජනීය සංයෝගවලින් ඇමෝනියා සෑදෙයි. ඉක්බිති ඉහත කී පළමුවැනි ප්‍රතික්‍රියා කලාපයේ අපවාහයෙන් එම ඇමෝනියා ඉවත් කරගනු ලැබේ. ඉන්පසු සෙ. 204° සිට 232° දක්වා අන්ත තාපාංකයක් ඇත්තා වූ, සාමාන්‍යයෙන් ද්‍රව සැහැල්ලු භාගයක් එකී අපවාහයෙන් වෙන් කර ගනු ලැබේ. ඒ සමගම එකී සැහැල්ලු භාගයේ අන්ත තාපාංකයට සහ සෙ. 343° ට අතර උෂ්ණත්වයක දී නටන අපවාහ සංරචක අන්තර්ගත බර භාගයක් ද එකී අපවාහයෙන් ම වෙන් කර ගනු ලැබේ. අනතුරුව දෙවැනි ප්‍රතික්‍රියා කලාපයක් තුළ දී ඉහත කී භාගයෙන් යුත් ධාරාවක්, නයිට්‍රජන් සංවේදී හයිඩ්රොබිඳුම් උත්ප්‍රේරකයක් ආශයේ දී, හයිඩ්රජන් සමග ප්‍රතික්‍රියා කරවනු ලැබේ. අන්තිමේ දී ඉහත කී පළමුවැනි ප්‍රතික්‍රියා කලාපයෙන් යටකී සැහැල්ලු භාගය වෙන් කර ගන්නට පෙර, එම පළමුවැනි ප්‍රතික්‍රියා කලාපයේ අපවාහයේ සාමාන්‍යයෙන් ද්‍රව කොටසත් සමග දෙවැනි ප්‍රතික්‍රියා කලාපයේ අපවාහයේ යටත් පිරිසෙයින් සාමාන්‍යයෙන් ද්‍රව කොටසවත් මිශ්‍ර කරනු ලැබේ.

අයිතිය ප්‍රකාශ කිරීම් 12 ක් ද, රූ සටහන් පත් 1 ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක්වූ ජූලි මස 21 වන දින,
කොළඹ දී ය.

9-311/7

---

### දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**වර්ෂ 1964 ක්වූ ජූනි මස 6 වන දින දරණ 5452 වන අංකය (61.11.8 දින සහ 939,200 වන අංකය දරණ එක්සත් රාජධානි පේටන්ට් බලපත්‍රය, 46 වන වගන්තිය යටතේ ලියාපදිංචිකිරීම)**

**UNIVERSAL OIL PRODUCTS COMPANY**

"උච්ච තාපාංක හයිඩ්රොකාබන තෙල් වර්ග, උත්ප්‍රේරකයක මාර්ගයෙන් හයිඩ්රොබිඳවීමේ ක්‍රියාවලිය".

**සංක්ෂේප සටහන—**

මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. එකතු කරන ලද හයිඩ්රජන් සහ හයිඩ්රොබිඳුම් උත්ප්‍රේරකයක් ආශ්‍රයේ දී උච්ච තාපාංක හයිඩ්රොකාබන තෙල් වර්ගයක්

වඩා වටිනා අවච තාපාංක හයිඩ්රොකාබන ඵල බවට පරිවර්තනය කිරීම සඳහා ක්‍රියාවලියක්. මෙහි විශේෂ ලක්ෂණයක් නම්, යටත් පිරිසෙයින් සෙ. 343° ට ඉහළ උෂ්ණත්වයකදී වත් නටන්නා වූ ද නයිට්‍රජනීය සහ සල්පර්මය හයිඩ්රොකාබන අන්තර්ගත වූ ද හයිඩ්රොකාබන තෙල් වඩියක්, සරු පලදාවක් අනුව නයිට්‍රජන් වලින් සහ සල්පර්වලින් සැලකිය යුතුව තොර වූ අවච තාපාංක, සාමාන්‍යයෙන් ද්‍රව හයිඩ්රොකාබන බවට පරිවර්තනය කර වීමයි. මෙය කරනුයේ එකී හයිඩ්රොකාබන තෙල්වලින් සහ පුනර්සංසරණය කරන ලද බර තෙල්වලින් යුත් මිශ්‍රණයක්, ප්‍රතික්‍රියා කලාපයක් තුළ දී, සාමාන්‍යයෙන් ද්‍රව හයිඩ්රොකාබන හෙක්ටොලීටරයකට, හයිඩ්රජන්වලින් සාමාන්‍ය ඝන මීටර 35.6 සිට 178 දක්වා වූ ප්‍රමාණයක් ආශ්‍රයේ දී, සෙ. 316° සිට සෙ. 454° දක්වා වෙනස් වන උෂ්ණත්වයක දී සහ වායුගෝල 54.5 සිට 204 දක්වා වූ පීඩනයක දී උත්ප්‍රේරකයක් සමග ගැටීමට සැලැස්වීමෙනි. මෙහි, බරින් 20% සිට 50% දක්වා වූ සිලිකා ප්‍රමාණයකින් ද බරින් 50% සිට 80% දක්වා වූ ඇලුමිනා ප්‍රමාණයකින් ද යුත් මෙම උත්ප්‍රේරක සංයුක්තයේ බරින් 10% ට වැඩි වූ ද 30% ට වැඩි නොවූ ද මොලිබ්ඩිනම් ප්‍රමාණයක් ද බරින් 1% සිට 6% දක්වා වූ නිකල් ප්‍රමාණයක් ද අන්තර්ගත ව තිබේ. (මෙකී මොලිබ්ඩිනම් සහ නිකල් පවතින්නේ එම මූල ද්‍රව්‍ය වශයෙන් ම හෝ ඒවායේ සංයෝග වශයෙන් හෝ වෙයි. ඒ තිබෙන ප්‍රමාණ ගණනය කරනුයේ එම මූල ද්‍රව්‍ය වශයෙන්මය. ඒ ප්‍රමාණ ඉහත කී ඇලුමිනා-සිලිකා සංයුක්තයේ බර මත පදනම් වී තිබේ.) මේ ගැටීම සිදුකරනුයේ ඉහත කී උත්ප්‍රේරකයේ එක පරිමාවකට එක පැයකට සාමාන්‍යයෙන් ද්‍රව හයිඩ්රොකාබනවලින් ද්‍රව පරිමා යටත් පිරිසෙයින් 0.5 ක් වත් ඇති අවකාශ ප්‍රවේගයක දී ය. ඉක්බිති ප්‍රතික්‍රියා කලාපයේ අපවාහයෙන්, හයිඩ්රජන් සල්පයිඩ් සහ ඇමෝනියා වෙන් කර ගනු ලැබේ. ඒ සමග ම අපවාහයෙන් හයිඩ්රජන් ගහණ වායුවක් වෙන් කර ගනු ලැබේ. ඉක්බිති ගැසොලින් භාගයක් සහ මධ්‍ය ආසූත භාගයක් බවට සහ සෙ. 343° සිට 371° දක්වා වෙනස් වන මුල් තාපාංකයක් ඇති උච්ච තාපාංක තෙල් භාගයක් බවට විභාජනය කිරීමෙන් එකී අපවාහයේ සාමාන්‍යයෙන් ද්‍රව හයිඩ්රොකාබන වෙන් කර ගනු ලැබේ. අන්තිමේ දී ඉහත කී උච්ච තාපාංක තෙල් භාගය, ඉහත සඳහන් පුනර්සංසරණය කළ බර තෙල් වශයෙන් ඉහත කී ප්‍රතික්‍රියා කලාපය තුළට ආපසු යවනු ලැබේ.

අයිතිය ප්‍රකාශ කිරීම් 5ක් ද, රූ සටහන් පත් 1ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක්වූ ජූලි මස 21 වන දින,
කොළඹ දී ය.

9-311/8

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලව්වේත්තයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්"හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි